( 16 )

# ඓතිහාසික ගණේගම පුරාණ විහාරය

එම්.පී. චන්දිමා සඳමාලි
තෙ වැනි වසර

රත්නපුර දිස්ත්‍රිකයේ ඓතිහාසික සිද්ධස්ථාන අතුරින් ගණේගම රජමහා විහාරයට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි. මෙය සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගණේගම ග්‍රාමයෙහි පිහිටා තිබේ. රත්නපුර නගරයේ සිට කහවත්ත දෙසට ගමන් කරන පුද්ගලයෙකුට කි.මී. 36 පමණ පැමිණි පසු වම් පැත්තෙන් මෙකී විහාරය දැකගැනීමට හැකිවේ. ගණේගම රජමහා විහාරයට ඇත්තේ අවුරුදු දහස් ගණනක් දීර්ඝ වු පුරාවෘත්තයකි.



අරමොණපොල විහාරය, දෙනවක විහාරය යන නම් වලින් ද මෙම ස්ථානය හඳුන්වනු ලැබේ. අරමණ දේශයෙන් වැඩම කරන ලද භික්ෂුන් වහන්සේලා ශ්‍රී පාදය වන්දනා කිරීම සඳහා පැමිණ නවාතැන් ගෙන ඇත්තේ ගණේගම විහාරයේ ය. අනුරාධපුර යුගයේ ප්‍රශ්චිම සමයේ කෘර චෝළ ආක්‍රමිකයන් විසින් ලක්දිව ශ්‍රී විභූතිය විනාශ කළා පමණක් නොව භික්ෂුන් වහන්සේ නමකට ජිවත් විය නො හැකි තත්ත්වයක් ඇති කරන ලදැයි මහාවංශයේ (76 පරිච්ඡේදය,229 පිටුව) සඳහන් වේ. මෙම විනාශයෙන් ලක්දිව මුදාගනු ලැබුවේ පොළොන්නරුව අගනගරය කරගත් පළමු විජයබා රජු ය. එතුමා රාජ්‍යත්වයට පත් වී විනාශ වි ගිය බුද්ධ ශාසනය නැවත ගොඩනැගීම සඳහා අරමණ දේශයෙන් භික්ෂුන් වහන්සේලා විසිනමක් වැඩම කරවු බව මහා වංශයේ සඳහන් වේ. උපසම්පදා කර්මයට ගණපූර්ණ භික්ෂුන් නොමැති බැවින් රාමඤ්ඤ රට අනුරුද්ධ නම් මිත්‍ර රජහු කරා පඩුරු සහිත දූතයන් යවා භික්ෂූන් වහන්සේලා වැඩම කරවා ගත් බව කිය වේ. අරමණ දේශයෙන් පැමිණි භික්ෂූන් වහන්සේලා ගණේගම රජමහා විහාරයේ නවාතැන් ගෙන ඇත. එම නිසා මෙම සිද්ධස්ථානයට අරමුණපොළ විහාරය යැයි භාවිතා කරයි.

දෙනවක නාමයෙන් හඳුන්වන්නේ ද මෙම ගණේගම විහාරය ම ය. පොළොන්නරු යුගයේ සිට ම මෙම ප්‍රදේශය දෝනාවක්ක යනුවෙන් හඳුන්වා ඇත. කිරිබත්ගල කඳු ශිඛරයටත් කුට්ටාපිටිය කඳු ශිඛරයටත් මැදි ව පිහිටීම නිසා දෙනවක යනුවෙන් හඳුන්වා ඇත. එම පිහිටීම ආරක්ෂක බලකොටු තනා ගැනීමට වැදගත් වී ඇත. පොළොන්නරුවේ රජකළ පළමු පරාක්‍රමබාහු රජතුමාට ලක්දිව එක්සේසත් කිරීමේ කාර්යයෙහිලා රුහුණ යටත් කර ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා යැවූ සේනාව බල කඳවුරු ගොඩනගාගෙන ඇත්තේ දෙනවක ප්‍රදේශයේ ය. පෘතුග්‍රීසි සෙන්පති අසවේදු දෙනවක බලකොටුව ගොඩනගාගත් බව ඓතිහාසික ව පිළිගැනේ.



ඡායාරූප 01.පැරණි බෝධිය

බටහිර අධිරාජ්‍යවාදි ආක්‍රමණිකයන්ගේ ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස මහනුවර සමයේ අවසානයේ ලක්දිව බුදුසසුනේ ඇතිවූ මහා පරිහානිය හේතුකොටගෙන මෙම ස්ථානයේ ගණින්නාන්සේලා නම් වූ භික්ෂු කොටසක් ජීවත්ව ඇත. විහාරයේ පරිපාලනය සිදුකර ඇත්තේ මෙම ගණින්නාන්සේලා ය. එම නිසා මෙම ස්ථානයට ගණේගම යයි කියනු ලැබේ.

ශ්‍රී ජය ශ්‍රී මහ බෝ සමිඳුන්ගේ ශාඛාවක් ගණේගම විහාර භූමියේ පිහිටා ඇත(චූල බෝධි වංශය, 94,95). මෙම බෝධීන් වහන්සේ ප්‍රාකාර තුනකින් ආවරණය කොට ඇත. මෙම බොධීන් වහන්සේට පූජා සඳහා පැමිණෙන සැදැහැතියන් අති විශාල ය.



ඡායාරූප අංක 02. විහාර ගෙය

විහාර ගෙය තුළ දැනට තැන්පත් කර ඇති දාරුමය පිළිම වහන්සේ විහාරස්ථානයේ ඇති පැරණිතම ප්‍රතිමාව යි. 1505 දී ලංකාවට පෘතුග්‍රීසීන් ඔවුන් යටතට ගත් ප්‍රදේශවල ප්‍රතිපත්තියක් ලෙස වෙහෙර විහාර විනාශ කළහ. පිළිම වහන්සේ ආරක්ෂා කිරීමට ජනතාව දෙනවක ගග ගැඹුරේ සගවා ඇත. පිළිමය පිටුපස ඇති සිතුවමින් එය පැහැදිලි වේ. දැනට විහාරයේ පිළිම වහන්සේලා තුන්නමක් තැන්පත් කර ඇත.

විහාරයේ උඩුමාලයේ දක්නට ඇති ප්‍රතිමා විෂ්ණුගේ දස අවතාරය වශයෙන් සමහර උගතුන් දක්වයි. මහනුවර සමයේ බුදු සමයට එක් වූ හින්දු බලපෑමේ ආභාසයෙන් නිමවන ලද්දක් බව මෙය සැලකිය හැකි ය.

ගණේගම විහාරයේ පිට මාලය වටා ඇති ගල් කුලුණු 24ක් ගල් උලුවහු 3ත් සඳකඩපහනත් ගලින් නෙලන ලද භාජන 2ත් දක්නට ලැබෙන පැරණි සාධක වේ. මෙහි ඇති කැටයම් ඉතා සංකීර්ණ වේ. කෝට්ටේ යුගයට අයත් ගල් උළුවස්සක් මෙහි ඇත. විහාරයේ දෙවන මාලයට ඇතුළුවන දොරටුවේ සවිකර ඇති මෙම ගල් උළුවස්සේ අලංකාර මොස්තර කිහිපයකි. විහාරයේ ඇතුළුමාලයට ඇතුල්වන දොරටුව සවිකර ඇති ගල් උළුවස්ස පැරණි සිංහල කලාකරුවා අනුව යමින් නිර්මාණය කර ඇත. ගණේගම විහාරය ඉදිකෙරුණ යුගයේ මූර්ති කලාවේ ප්‍රධාන කාර්යය වූයේ ගොඩනැගිලි අලංකාර කිරීම ය. ඒ සඳහා යොදාගත් පරම්පරාගත අංගවලින් එකක් වූ සඳකඩපහණ සියවස් ගණනක් තිස්සේ වෙනස් වී තිබී මේ යුගයේදී ගොඩනැගිලි අලංකාර කිරීම සඳහා යොදාගෙන ඇත. විහාරයේ ඉදිරිපස ගලින් නිමවන ලද සඳකඩපහණ සත්ත්ව රූපවලින් හා පලාපෙතිවලින් අලංකාර වී ඇත. සඳකඩපහණ වෙනස් වී විකාශනය වීම දැකීමට හොඳ නිදර්ශනයකි.

අනුරාධපුර පොළොන්නරු යුගවල දී බහුල ව ම සෑම තැනක ම දැකිය හැකි ගල් කැටයම් පසු කාලයේදී දක්නට නොමැත. පසුකාලීන ව රට තුළ පැවති දේශපාලන අස්ථාවර භාවයන් මෙවැනි කැටයම් දක්නට නො ලැබීමට එක් හේතුවක් වන්නට ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ ම ගල් කැටයම් බහුල ව ඇති එකම පූජනීය ස්ථානය ගණේගම රජමහා විහාරය ය. එමෙන් ම අතීත සිංහලයාගේ කලා රසිකත්වයත් ආගම භක්තියත් ශිල්පීය කෞෂල්‍යයත් මෙම නිර්මාණ තුළින් මැනවින් ප්‍රකට වේ.

මෙම විහාරයෙහි දක්නට ඇති සිතුවම් හා නටඹුන් සියල්ල ම කෝට්ටේ යුගයට අයත් යැයි ආචාර්ය සිරි ගුණසිංහ මහතා පවසයි **"සිංහල රාජධානිය කෝට්ටේ වැනි තැන් වලට සම්ප්‍රාප්ත වීමත් සමග සබරගමු ප්‍රදේශයේ අගයෙන් වැඩි වුවත් දැනට ඉතිරි ව ඇති වෙහෙර විහාර ආදියත් බිතුසිතුවම් ආදියත් එතරම් පැරණි නැත. සබරගමුවේ බිතු සිතුවම් අතරින් පැරණි සිතුවම් අයත් වන්නේ මහනුවර යුගයට යැයි කිව යුතු ය"** (ගුණසිංහ, 1962). විහාරයෙහි ඇති වියන් සිතුවම් ඉතා වටිනා මෙන්ම වැදගත් ම සිතුවම වේ. පෙරදිග සංස්කෘතිය ලෝකයට හඳුන්වා දුන් ආනන්ද කේ. කුමාරස්වාමි මහතා මධ්‍යකාලීන සිංහල කලා නැමැති සිය කෘතියේ මෙම වියන් සිත්තම් ගැන සඳහන් කොට ඇත්තේ මෙසේ ය "ලැලි වල සිත්තම් කෙරුනු මල් සැරසිල්ල ජීව බලයෙන් හා උනන්දුවෙන් පිරී පවතී. එහි උනන්දු ශක්තිය මැඩ පැවැත්විය නො හැකි තරම් ය. එසේ වුවද මේ ජීව බලය හැම විටම සායන්මිත වූ වර්ධනය පිළිබඳ ජීව බලයකි.

ලෑලී දරා සිටින්නා වූ ද වහලයේ හා සිවිලිමේ අංග වූ ද දෙපස පිහිටි බාල්ක කෙරෙහි සිත් යොමු කරන විට මේවා බොහෝ වෙනස් ලෙසකට සරසන ලද බව අපට පෙනේ. වියන් සිත්තම් කරන ලද ලතාවේ වෙනස් වන සුලු බවට හා උන්නු ශක්තියට විශේෂයෙන් අසමාන වූ පුන පුනා යෙදුනු වෘත්තාකාර මෝස්තර ස්ථිරත්වය හා නිශ්චලත්වය පවසයි. මෙය මේ සැරසිල්ලෙහි ගෘහ නිර්මාණාත්මක ගුණය දක්වන වැදගත් නිදසුනකි. වක්‍ර මෝස්තරයන්ගේ පරමාර්ථයේ අගය කිරීම හෝ ඔවුන් අලංකරණයෙහිලා නිවැරදි ලෙස යෙදීම හෝ මෙයට වැඩි තරම් වන නිදසුනක් නො විය හැකි ය.

මෙසේ මෙම වියන් සිත්තම ගෘහ නිර්මාණාත්මක ගුණය දක්වන ඉතා වැදගත් නිදසුනක් ලෙස කුමාරස්වාමි මහතා දක්වා ඇත. මෙයට දිය හැකි තවත් නිදසුනක් නැතැයි ඒ මහතා සදහන් කරයි. එවැනි ශ්‍රේෂ්ට කලා නිර්මාණ ගණේගම විහාරයෙහි දැකිය හැකි ය. මෙකී පුරාවිද්‍යා ස්ථානය සුරැකීම ජාතියේ යුතුකමකි.

### ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය

උඩුනුවර දේවානන්ද හිමි, පල්ලෙවෙල දේවරක්ඛිත හිමි, පාතකඩ විමලරතන නාහිමි, 2012, ***අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය***, විද්‍යාලංකාර මුද්‍රණාලය

දිසානායක බී.ජේ., 2002, ***ජය ශ්‍රී මහා බෝධිය***, ගොඩගේ පොත් මැදුර, ගොඩගේ සහ සහෝදරයෝ, 661, පී ද. එස් කුලරත්න මාවත, කොළඹ 10

යටවර එස්. එම්. ඩී. එම්., 2006, ***චූලබෝධි වංසයෙන් හෙළිවන පුන්‍ය භූමි***, ආරිය ප්‍රකාශකයෝ, බෞද්ධාලෝක විද්‍යාල මාවත, වරකාපොළ

ශ්‍රී සුමංගල නායක මාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ඛිත පඩිතුමන්, ***මහාවංසය සිංහල ද්විතීය භාගය***, ගොඩගේ පොත් මැදුර, ගොඩගේ සහ සහෝදරයෝ, 661, පී ද.එස් කුලරත්න මාවත, කොළඹ 10

සංවාද -1.බැරැණ්ඩුවේ පියරතන ස්වාමීන් වහන්සේ

2.ජයතිලක ආර්.ඒ, ගොඩගම, පාතකඩ ,පැල්මඩුල්ල

සේනානායක පී.බී, ***ලංකාවේ රජවරු සහ පාලකයෝ***, තරංග ප්‍රින්ටස්, 3/52, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රතුපස්වල, මුදුන්ගොඩ.

සිරි ගුණසිංහ, ***මහනුවර යුගයේ බිතු සිතුවම් ප්‍රාදේශික ශෛලි සබරගමුව***, 16 කලා සගරාව, 9 කලාපය 1962, දෙසැම්බර්